# 12 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව 11 වන සතිය - ජූලි 13 සිට 17 දක්වා

## නිපුණතා මට්ටම 1.6 - මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සංවිධානය වන ආකාරය විශ්ලේෂණය කරයි.

- **ආර්ථික පද්ධතිය/ආර්ථික සංවිධානය -**

මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජයක් තුළ ජීවත් වන මිනිසුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇති යන්ත්‍රණය හෙවත් ආයතනික වැඩ පිළිවෙල ආර්ථික පද්ධතියක් හෙවත් ආර්ථික සංවිධානයක් ලෙස හැඳින්වේ.

ආර්ථික පද්ධතියක දී මිනිසා විසින් සකසා ගන්නා නීති මාලාවකට අනුව එහි ඇති ආයතන සමූහයක් ක්‍රියාත්මක වේ.

එම ආයතන මිනිසුන්ගෙන් සමන්විත සජීව ඒකක වන අතර,ඒ නිසා ම එහි ක්‍රියාකාරීත්වය ද සක්‍රීය වූවකි. භෞතික පද්ධතියක් තුළ පවත්නා ස්වාභාවික වස්තු මෙන් ආර්ථික පද්ධතියක් තුළ දක්නට ලැබෙන වස්තු වන්නේ එහි පවත්නා ආර්ථික ආයතන ය.

මෙම ආර්ථික ආයතන ආර්ථික පද්ධතියක මූලිකාංග,ආයතනික ලක්ෂණ ආදී නම්වලින් ද හැඳින්වේ.

ඒ ඒ රටවල පවතින සමාජ,සංස්කෘතික සහ ඓතිහාසික රටාවන් මත විවිධ ස්වරූපයේ ආයතනික රටාවන් ඒ ඒ ආර්ථිකයන්හි දැකිය හැකිය.

<u>අභ්‍යාස</u>

1.) ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන මූලිකාංග කිහිපයක් නම් කරන්න.
2.) ඒ අතුරෙන් ආර්ථික පද්ධතියක තීරණ ගැනීම හා සම්බන්ධ වන විශේෂ පාර්ශ්ව මොනවාද?
3.) එම විශේෂ පාර්ශ්වවල කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.